# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2151/22 – 2019 නොවැම්බර් මස 26 වැනි අඟහරුවාදා – 2019.11.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක: IR/22/29/2012.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

අංක 2127/6 දරන හා 2019.06.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් වැලිකන්ද, බී කලාපය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හි ටී. එම්. නන්දසෝම මයා, සිංහපුර, බී කලාපය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හි එච්. පී. කේ. යූ. පතිරත්න මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3663 දරන හා 2019.05.07 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20 (1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3663 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2020.06.10 දින සිට අවසන් වන බවට පනතේ 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,<br>
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 නොවැම්බර් මස 13 වැනි දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.

1A – G 31568 – 13 (2019/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

***පළමුවන උපලේඛනය***

"අ" ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත
බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, කොළඹ 10.
2019.07.09.

**කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට ය.**

2019.06.10 දිනැති අංක 2127/6 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද්දා වූ ද ටී. එම්. නන්දසෝම මයා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, "බී" කලාපය, වැලිකන්ද එච්. පී. කේ. යූ. පතිරත්න මයා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, "බී" කලාපය, වැලිකන්ද සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10 බැඳී සිටින්නාවූ ද 2019.05.07 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.**

පිටපත (අනෙක් පාර්ශවයන්)

01. ටී. එම්. නන්දසෝම මයා,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
"බී" කලාපය, වැලිකන්ද.

02. එච්. පී. කේ. යූ. පතිරත්න මයා,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
"බී" කලාපය, වැලිකන්ද.

12 - 340

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.